# මහා සම්ප්‍රදායේ කුරුබව

පසුගිය සතියේ පළවූ ලිපියෙහි ඇති වැරැද්දක් නිවැරදිකළ යුතුව ඇත්තේ ඉන් මුළුමනින් ම විරුද්ධ අදහසක් නිරූපණය වන බැවිනි. එහි හත්වැනි ඡේදයෙහි පාළි භාෂාවෙහි ව්‍යාකරණය යනුවෙන් ඇරඹෙන වාක්‍යය පහත සඳහන් අයුරින් නිවැරදි විය යුතු ය. “පාළි භාෂාවෙහි ව්‍යාකරණය සිංහල භාෂාවේ ව්‍යාකරණය දෙස බලා සකස් කරන ලද්දක් නොව, (ලේඛන) සිංහල භාෂාවට හිමිකර දී ඇති ව්‍යාකරණය පාළි (හා සංස්කෘත) ව්‍යාකරණ දෙස බලා සකස් කරන ලද්දක් බවට සාක්ෂි වෙයි.”

මාර්ටින් වික්‍රමසිංහ මහතා මෙරට සංස්කෘතිය භාරතීය සංස්කෘතියෙන් අදීන බව පෙන්වීමට උත්සාහ කෙළේ අපේ සංස්කෘතිය බටහිර සංස්කෘතිය සමග සංසන්දනය කරමින් ය. ජාතක කතා බටහිර කෙටිකතාව සමග සසඳමින් ඒ දෙකෙහි ම ඊනියා යථාර්ථවාදී රීතියක් තිබෙන බව පෙන්වීමට ඒ මහතා උත්සාහ කෙළේ ය. ඉන් කියැවෙන්නේ අපේ පැරැන්නන්ගේ දීනත්වයක් නොවුණ ද  වර්තමානයේ අපට බටහිර සමග එක්වීමට ඇති අවශ්‍යතාව ය. එහි දීනකමක් ඇත. ඒ දීනකම අපට ලැබෙන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ සංස්කෘතික ආධිපත්‍යය ඔස්සේ ය. අප බටහිර විද්‍යාව ඇතුළු බටහිර දැනුමේ ආධිපත්‍යයට යටවී සිටිනතාක් අපට ඒ දීනත්වයෙන් ගැලවීමක් නැත. වික්‍රමසිංහ මහතාගේ සාහිත්‍ය නිර්මාණ මෙන් ම සාහිත්‍ය විචාරය ද බටහිර දැනුම් ආධිපත්‍යයට හා නූතනත්වයට යටවීමෙන් ලැබුණු දෑ විය.

කුමාරතුංග මහතා භාරතයෙන් නිදහස්වීමට උත්සාහ කෙළේ වික්‍රමසිංහ මහතා තරම්ම බටහිර දැනුමට ගැති වී නොවුණ ද ඒ මහතා ද බටහිර නූතනත්වයෙන් නිදහස් වී නො සිටියේ ය. එසේ ම ඒ මහතාට ද හෙළ හවුලේ සාමාජිකයනට ද අතීතයේ ලෝකයට දැනුම ලබාදුන්නේ ලංකාවෙන් ය යන අදහස තිබිණි. අද එය ඇතැමුනට රෝගයක් වන තරමට උත්සන්න වී ඇත. අපේ දැනුම් ලෝකයා විසින් ලබාගෙන ඇති බව සැබෑ ය. එසේ ම අපි ලෝකයෙන් ද දැනුම් ලබාගෙන ඇත්තෙමු. සංස්කෘතිය හා එහි අංගයක් වන දැනුම සංස්කෘතික යටත්විජිතවාදයක් ක්‍රියාත්මක නොවන කාලයක සංස්කෘතියෙන් සංස්කෘතියට අවශෝෂණය කරගනු ලැබේ. එහි දී ඊනියා මහා සම්ප්‍රදාය චූල සම්ප්‍රදාය ආදී සංකල්ප අදාළ නොවනවා පමණක් නො වෙයි. ඒ සංකල්පයෙහි වලංගුබවක් ද නැත.

අපේ කුරු උගතුන් තවත් කුරු වී ඇත්තේ මේ මහා සම්ප්‍රදාය චූල සම්ප්‍රදාය ආදී බහුබූත සංකල්පවලින් හා උසස් නැත්නම් මහා සංස්කෘතිය යන සංකල්පයෙනි. මේ සංකල්ප අභිරුචියෙන් යොදාගන්නා පඬියන්ට අනුව සිංහල සංස්කෘතිය උසස් නැත්නම් මහා සංස්කෘතියක් නො වේ. එමෙන් ම ඔවුන්ට අනුව අපට ඇත්තේ චූල සම්ප්‍රදායකි. ප්‍රබුද්ධයන් ලෙස පෙනී සිටින අනුකාරකයන් රැසක් (රැළක්) ම සිංහල සංස්කෘතිය පහත්කර සැලකීම සඳහා මේ සංකල්ප යොදාගනු දක්නට හැකි ය.

මහා සම්ප්‍රදාය, චූල සම්ප්‍රදාය යන සංකල්පවල නිර්මාතෘවරයා වූයේ රෙඩ්ෆීල්ඩ් නම් බටහිර මානවවිද්‍යාඥයෙකි. ඔහු මායා ශිෂ්ටාචාරයට අයත් යුකාටාන් නම් ප්‍රදේශයේ සංස්කෘතිය හදාරා මේ සංකල්ප ඉදිරිපත්කළේ ඒ ඇසුරෙන් තම දත්ත පැහැදිලි කිරීමට ය. ඔහුට අනුව සංස්කෘතීන් මහා සම්ප්‍රදාය, චූල සම්ප්‍රදාය යනුවෙන් කොටස් දෙකකට බෙදිය හැකි ය . මහා සම්ප්‍රදායෙහි නිර්මාණය වන සංස්කෘතිය සමස්තයක් ලෙස ගත්කල චූල සම්පයදායෙහි සංස්කෘතීන් විසින් අනුකරණය කරනු ලැබෙයි. එහෙත් ඒ අනෙක් පැත්තට සාමාන්‍යයෙන් ක්‍රියාත්මක නො වෙයි.

මහා සම්ප්‍රදාය නගර ආශ්‍රිත ව බිහිවෙයි. චූල සම් ප්‍රදාය ඇත්තේ ගම්වල ය. සංස්කෘතිය බොහෝවිට නගරයෙන් ගමට ගලා යන මුත් ගමෙන් නගරයට නො ලැබෙයි. රෙඩ්ෆීල්ඩ් මායා ශිෂ්ටාචාරය තේරුම් ගැනීමට මහා සම්ප්‍රදාය, චූල සම්ප්‍රදාය යන සංකල්ප යොදාගත්ත ද ඔහුට අවසාන වශයෙන් අවශ්‍ය වී තිබුණේ කුමක් ද යන්න පැහැදිලි ය. ඔහු හා ඔහුගේ අනුගාමිකයෝ මහා සම්ප්‍රදාය, චූල සම්ප්‍රදාය යන සංකල්ප මායා සංස්කෘතියෙන් බැහැරව ද යොදාගත්හ.  මේ සංකල්පයේ අවසන් අරමුණ වූයේ බටහිර නූතනත්වයේ සංස්කෘතිය මහා සම්ප්‍රදාය බවත් අප අයත්වන්නේ චූල සම්ප්‍රදායට බවත් තහවුරු කිරීම ය. අපට අද සංස්කෘතිය ලැබෙන්නේ බටහිරින් ය.එය අනුකරණය කිරීම හැරෙන්නට අපට කළහැක දෙයක් නැත.

© Prof. Nalin De Silva

රෙඩ්ෆීල්ඩ් මායා ශිෂ්ටාචාරය පිළිබඳ කිනම් බයිලා කීව ද ඔහුට අවශ්‍ය වුයේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ හා බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියේ ආධිපත්‍යය තහවුරු කිරීම ය. ඒ ආධිපත්‍යයෙහි සංස්කෘතික යටත්විජිතවාදයට අනුව අප මත බටහිර සංස්කෘතිය බලයෙන්, ඇතැම් විට උපක්‍රමිකව පැටවෙයි. මේ පැටවීම සංස්කෘතික යටත්විජිතවාදයක් නිසා නොව ස්වාභාවික ව සිදුවන්නක් ලෙස පෙන්වීම රෙඩ්ෆීල්ඩ්ගෙ අරමුණ විය. වෙනත් වචනවලින් කියන්නේ නම් ඔහුට අවශ්‍ය වුයේ සංස්කෘතික යටත්විජිතවාදයක් නැති බවත් අප බටහිර සංස්කෘතිය අනුකරණය කරන්නේ බටහිර මහා සම්ප්‍රදායේ නිසාත් අප චූල සම්ප්‍රදායේ නිසාත් බව කීමට ය. අප චූල සම්ප්‍රදායේ වැසියන් ලෙස මහා සම්ප්‍රදාය අනුකරණය කළ යුතු ය. ඕනෑම මහා සම්ප්‍රදායේ සංස්කෘතියක් හා චූල සම්ප්‍රදායේ සංස්කෘතියක් මුනගැසුනු විට එවැන්නක් සිදුවෙයි. ඒ බටහිර සමාජ විද්‍යාවට අනුව ප්‍රකාශ කෙරෙන්නෙකි. බටහිර සමාජ විද්‍යාව බටහිර දැනුමක් ලෙස වාස්තවික ය. ඒ ඊනියා යථාර්ථවාදී ය. අප බටහිරයන් අනුකරණය කරන්නේ බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයක් නිසා නොව ඒ ස්වාභාවික ක්‍රියාවලියක් නිසා ය. ඒ ස්වාභාවික ක්‍රියාවලිය වාස්තවික වු ද යථාර්ථවාදී වු ද වෙයි. ඒ බව බටහිර සමාජ (මානව) විද්‍යාවෙන් කියැවෙයි. කෙටියෙන් කිවහොත් බටහිරයන් අනුකරණය කිරීම විද්‍යාවට එකඟ ව සිදුවෙයි.

මහා සම්ප්‍රදාය චූල සම්ප්‍රදාය ප්‍රවාදය සංගත නොවන බව පෙන්වීම අසීරු නො වේ. සංස්කෘතිය යන්න එක් පැත්තකට පමණක් ගලා යන්නක් නො වේ. බටහිර භෞතික විද්‍යාවෙහි විද්‍යුත් ධාරාවක්, පොල් ගෙඩියක් වැනි ගුරුත්වාකර්ෂණ ක්ෂෙත්‍රයක චලනය වන වස්තුවක්, ජල ධාරවක් ආදිය ඒ ඒ ක්ෂෙත්‍රයෙහි ඉහළ විභවයක සිට පහත විභවයකට ගමන් කරයි. එහෙත් සංස්කෘතිය එසේ ඉහළ විභවයක සිට පහළ විභවයකට එක් පැත්තකට ගලා යන්නක් නො වේ. රෙඩ්ෆීල්ඩ්ට බටහිර මානව විද්‍යාවෙහි මහා සම්ප්‍රදාය චූල සම්ප්‍රදාය සංකල්පය නිර්මාණය කිරීමේ දී බටහිර විද්‍යාවේ අනෙක් දැනුම් පද්ධතීන්හි තිබූ විභවය යන සංකල්පය බලපාන්නට ඇත. කාල් මාක්ස්ට තම ඊනියා ඓතිහාසික භෞතිකවාදය නිර්මාණය කිරීමේ දී ඩාවින්ගෙ පරිණාමවාදය බලපා ඇති බව මාක්ස් ම පිළිගත්තේ ය. ඒ දැනුම සංස්කෘතිය මත පදනම් වන බැවිනි. රෙඩ්ෆීල්ඩ ක්‍රියාත්මක වුයේ මානව විද්‍යාවෙහි වුවත් ඔහුට තම සංස්කෘතිය විසින් විවිධ අවස්ථාවල දී අනෙක් ක්ෂෙත්‍රවල නිර්මාණය වී තිබූ දැනුම ලබාගැනීමේ හැකියාව විය.

රෙඩ්ෆීල්ඩ් අනෙක් බටහිර දැනුම් පද්ධතීන්ගෙන් ලබාගත් විභවය යන සංකල්පය විභවය යන වචනය නොමැතිව යොදාගෙන ඇති බව පැහැදිලි ය. සංස්කෘතිය ගලායෑම පිළිබඳ ප්‍රවාදයක් නිර්මාණය කළ රෙඩ්ෆීල්ඩ් ඒ ඔස්සේ බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදී සංස්කෘතිය අනෙක් සංස්කෘතීන් මත බලයෙන් හෝ උපක්‍රමයෙන් හෝ පැටවීම එසේ නොවන බව පෙන්වීමට උත්සාහ කෙළේ ය. එහෙත් සංස්කෘතිය සාධාරණ වශයෙන් ගත්කල දෙපැත්තට ගලා යයි. ඒ එසේ නොවන්නේ සංස්කෘතික යටත්විජිතවාදයක් ක්‍රියාත්මක වී ඒ එක් පැත්තකට පමණක් ගලා යෑමට සැලැස්වූ අවස්ථාවල ය. එවැනි අවස්ථාවල ද සංස්කෘතික යටත්විජිතවාදය  තවත් ආකාරයකට ක්‍රියාකරමින් යටත්විජිතයෙහි සංස්කෘතිය තමන්ට අවශ්‍ය පරිදි ගැනීමේ ක්‍රියාවලියක නිරත වෙයි. අපේ රටේ තිබූ වෙදකමේ වර්ගීකරණය ලන්දේසීන් විසින් තම රටට ගෙන යන ලද්දේ ඒ නියමයට එකඟව ය. එමෙන් ම අපේ කලා නිර්මාණ බ්‍රිතාන්‍යයන් විසින් රැගෙන යන ලද්දේ සංස්කෘතික යටත්විජිතවාදීව ය. බ්‍රිතාන්‍ය කෞතුකාගාරය යනුවෙන් ප්‍රසිද්ධ වී ඇති ආයතනය සංස්කෘතික යටත්විජිතවාදයේ ප්‍රතිඵලයක් ලෙස යටත්විජිතවලින් බ්‍රිතාන්‍යයට ගෙන යන ලද කෘතීන්ගේ එකතුවක් ලෙස පෙනී යෑම පුදුමයක් නො වේ.

රෙඩ්ෆීල්ඩ්ගෙ යටත්විජිතවාදී  සංකල්පය ලංකාවට හඳුන්වාදුන්නේ එදිරිවීර සරච්චන්ද්‍ර මහතා ය. ඒ මහතා ඒ සම්බන්ධයෙන් ඉංගිරිසියෙන් ලියන ලද ලිපියක් හැටගණන්වල මුල විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගේ සඟරාවක සිංහලට පරිවර්තනය කර පළකිරීමත් සමග සිංහල පාඨකයන් අතර ද මේ සංකල්පය පැතිරී ගියේ ය. අද එය සිංහලයෙහි ඉවක් බවක් නොමැතිව යොදාගන්නා සංකල්පයක් බවට පත්වී ඇත. සිංහලයන් අද ඒ යොදාගන්නේ කිනම් අර්ථයකින් ද යන්න පැහැදිලි නැත. පසුගියදා අළුත් සහල් මංගල්‍යය ගැන පැවති රූපවාහිනී සාකච්ඡාවක දී එහි මහා සම්ප්‍රදායක් හා චූල සම්ප්‍රදායක් ගැන කියනු අසා සිටියෙමි. රජුගේ මැදිහත්වීමෙන් කෙරුණු වත් පිළිවෙත් මහා සම්ප්‍රදාය ලෙස ද ඒ ඒ යායේදී ගොවීන් විසින් කෙරුණු වත් පිළිවෙත් චූල සම්ප්‍රදාය ලෙස ද හැඳින්විණි. ඒ යෙදුම රෙඩ්ෆීල්ඩ්ගෙ සංකල්පය සමග කිසිම සම්බන්ධයක් නැත.

© Prof. Nalin De Silva

බටහිර සංකල්පයක් අපට වුවමනා ආකාරයට සකස්කරගැනීම වරදක් නො වේ එහෙත් එසේ යොදාගැනෙන සංකල්පය මුල් සංකල්පයෙන් වෙනස් බව අප දැනගත යුතු ය. එමෙන් ම යම් අයුරකින් සකස්කරගන්නා ලද සංකල්පය ඉංගිරිසියට පරිවර්තනය කරන්නේ නම් එහි දී රෙඩ්ෆීල්ඩ්ගේ අදාල ඉංගිරිසි වචන යොදා නොගැනීමට අප ප්‍රවේසම් විය යුතු ය. නැතහොත් ඉංගිරිසියෙන් ලිපිය කියවන විදේශිකයකු මුළුමනින් ම වැරදි අර්ථකථනයක් දෙනු ඇත. වේදිකාවේ ගී ගැයීම මහා සම්ප්‍රදාය ලෙසත් පදික වේදිකාවේ ගී ගැයීම චූල සම්ප්‍රදාය ලෙසත් ඇතැම්විට හැඳින්වෙන්නේ සිංහලයන්ගේ සංකල්පයෙන් මිස රෙඩ්ෆීල්ඩ්ගේ සංකල්පයෙන් නො වෙයි. සිංහලයන් ඇතැම්විට ඒ සංකල්පය යොදාගන්නේ ලොක්කන්ගේ සම්ප්‍රදාය හා සොක්කන්ගේ සම්ප්‍රදාය යනුවෙන් බව පැහැදිලි ය.

එහෙත් රෙඩ්ෆීල්ඩ් ඒ සංකල්පය යොදාගත්තේ එවැනි අර්ථයකින් නො වෙයි. ඔහුගේ සංකල්පය විසින් කරන ලද්දේ අප වැනි රටවලට මහා සම්ප්‍රදායක් නොතිබූ බව පෙන්වා දීම ය. රෙඩ්ෆීල්ඩ්ගේ අර්ථයෙන් අද ලෝකයේ මහා සම්ප්‍රදාය බටහිර ක්‍රිස්තියානි නූතනත්වය වෙයි. එදා අපේ මහා සම්ප්‍රදාය ඒ අර්ථයෙන් ම භාරතීය සම්ප්‍රදාය විය. අපට කළ හැකිවූයේ ඒ මහා සම්ප්‍රදායේ කුඩා කොටස් දුර්වල ආකාරයෙන් ලබාගැනීම පමණකි. මේ සංකල්පය මෙරට ඇතැම් සිංහල උගතුන් අතර හැටගණන්වලට පෙර ද නොතිබුණා නො වෙයි. කුරු උගතුන් වූ මොවුන් දඟනවවැනි සියවසේ පටන් ම භාරතයට නමස්කාර කිරීම අරඹා තිබුණි. වෙදකම සංගීතය ආදිය ඉගෙනීමට ඉංගිරිසින්ගේ ඉන්දියාවට ගිය මොවුන්ගෙන් ඇතැමකු ආපසු පැමිණීමෙන් පසුව ඉන්දියානුවන් ලෙස හැසිරීම පුදුමයක් නො වෙයි. එහෙත් වියුක්ත සංකල්පීය චින්තනයෙහි දක්‍ෂයන් නොවූ මොවුනට ඉන්දියාව අපට වඩා උසස් ය යන්න ප්‍රකාශකිරීම සඳහා සංකල්පයක් නො වී ය. සරච්චන්ද්‍ර මහතා රෙඩ්ෆීල්ඩ්ගේ සංකල්පය හඳුන්වාදීමෙන් ඔවුන්ට එවැනි සංකල්පයක් ලබා දී ඔවුන්ගේ කුරුබව ලියාපදිංචි කෙළේ ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva